25 වන පිටෙන්

වත්තේ ප්‍රසංගයට සහභාගීවීමට පැමිණියේ අවසාන මොහොතේය. ප්‍රේක්ෂක ප්‍රතිචාර ඉතාම ඉහළය. තවත් ගීත කිහිපයක් ගායනා කළේ තම ශරීරයේ ඇති අපහසුවට වඩා තම රසික රසිකාවන්ගේ කැමැත්තට ඉඩහසර ලබා දෙමිනි. මට මතක නැති බුද්දකගේ පළමු උපන් දිනයේ ගී ගැයූ එම්. එස්. අන්කල් මේ ගයන්නේ අවසන් ගීතය බව හැටට හැටේ ආතල් එකේ ලෙල්ලමේ සිටි මිනිසුන්ටද ඊළඟට පෝලිමේ සිටි කිර්තී පැස්කුවෙල්ට ද වැටහුනේ නැත.

**පෙම් ලොව නින්දෙදි**
**මා දුටු සුන්දර සිහිනේ**
**දැන් එලි වී ඇත හඳ වගෙ**
**ලස්සන මුහුණේ**
**හද පොපියයි සිත නලියයි**
**බැලූ බැලූ අත එළියයි**

ඒ හා සමානව විවිධ ගීත ඉල්ලීම් ද කිහිප යකි. පෙම් ලොව නින්දෙදි දුටු සුන්දර ස්වප්නයක් ගැන ඔහු ගීතය ගැයුවේය. ප්‍රතිචාර තව තවත් ඉහළය. හෙතෙම තවත් ගීත කිහිපයක් ගායනා කළේ තම ශරීරයේ ඇති අපහසුවට වඩා තම රසික රසිකාවන්ගේ කැමැත්තට ඉඩහසර ලබා දෙමිනි.

**රන්වන් වත බබලන්නේ**
**මල් මල් මදහස දෙන්නේ**
**නාරි ලතා ලීලෙ පපා පාදෙ නගාලා**
**චන්ද්‍රසිකා කන්ද කපා එන්න එබීලා**

**දිස්නෙ දිදී රශ්මි කඳන් දෑලෙ විදාලා**
**දිස්නෙ දිදී රශ්මි කඳන් දෑලෙ විදාලා**

1936 මාර්තු හතරවන දාවක ඉපදී 1994 අප්‍රේල් නවවනදාවක දිවියෙන් සමුගත් මහගමගේ සැම්සන් ප්‍රනාන්දු හෙවත් ආදරය නමින් හැඳින්වෙන එම්.එස්. ගේ ජීවිත කාලය පණස් අට වසරක් වැනි කෙටි කාලයකට සීමාවීම දුකට කරුණකි. ඔහු ගායනයෙහි, රංගනයෙහි, ගේය පද රචනයෙහි, සංගීත නිර්මාණයෙහි දැනුමකින් හා කෞශල්‍යයකින් හෙබි, බහුවිධ නිපුණතා සතු වූ දුලබ ගණයේ කලාකරුවකු වූයේය. භාෂා පහකින් ගී ගැයීමට සමත් වූ එම්.එස්. චිත්‍රපට 150ක පමණ පසුබිම් ගායනයෙන් දායක වී ඇත. චිත්‍රපට 25කට වඩා සංඛ්‍යාවක නළුවකු ලෙස රඟපාමින් තම රංගන කුසලතා ප්‍රකට කොට සිටින චරිතයකි.  එකම චිත්‍රපටයකට ගීත වැඩිම ගණනක් ගයා ඇත්තේ එම්. එස් ය. ඔහු විසින් ගායනා කොට ඇති ගීතාවලිය පන්සියයක් ඉක්මවා ඇතැයි හඟිමි. එකී ගී සියල්ල ගායන ශෛලිය, ගීත සඳහා පාදක වූ අත්දැකීම, සංගීත නිර්මාණය, තනුව හා රිද්මය අතින් එකිනෙකට වෙනස් ගීතාවලියක මිහිර අප හදට ළං කරන්නකි.

දවසක් අපේ ගමේ සංගීත සංදර්ශනයක් තිබුණා. එතකොට මට වයස අවුරුදු දහසයක් විතර ඇති. ඒ ප්‍රසංගයේදී මමයි මගේ මිතුරෙකුයි එකතු වෙලා තාත්තයි ජෝති අන්කලුයි කියන ගීතයක් ගායනා කළා. ගීතය අතරමගදී සෙනග බලාගෙන ඉද්දිම එක පාරටම මට කණ හරහා විදුලි කොටනවා වගේ පහරක් වැදුණා. බලන කොට තාත්තා මට ගහලා තියෙන්නේ.

ජෝති අන්කල් හිනාවේවී බලාගෙන හිටියා. එදා සවස තාත්තා අපි හැමෝටම කන්න බොන්න ගොඩාක් අරන් ආවා. ඇවිත් මාව ළඟට අරන් කිව්වා "පුතේ මම නැති කාලෙක මගේ සිංදු කියපන්. මම රුපියල් පන්සියයක් ගන්න තැනට ඔයාව රුපියල් පනහට මිනිස්සු ගෙනි යනවා. එතකොට මේ පවුල ජීවත් වෙන්නේ කොහොමද කියලා ඇහුවා. දුකටම මට එදා හොඳටම ඇඬුනා. තාත්තා අපිට කොච්චර තරවටු කළත් හිත යටින් එයා දුක් වුණා අපිට දඬුවම් දෙන්න වීම ගැන. එයා කොයි තරම් දරදඬු තීරණ ගත්තත් අභ්‍යන්තරයෙන් හරිම සංවේදි චරිතයක්. මිනිසුන්ට පුළුවන් හැම වෙලාව කම උදවු කරනවා. එයා ගායනයට වගේම ගීත රචනයටත් හරිම දක්ෂයි. එයා ගායනා කරපු ගීතවලින් සියයට අසූවක් පමණ තාත්තගෙම ගීත රචනා. අලුත් පරපුරකට ඉදිරියට එන්න එයා හැම වෙලාවෙම අත දුන්නා. අපේ බාප්පා වෝල්ටර් ඉන් එක් කෙනෙක්. සුසිල් අයියා කදුලක් ඇස් දෙබොක්කාවේ හිරකර ගනී.

තාත්තා කෑවා බිව්වා, විනෝද වුණා වගේම බිරිඳගේ, දරුවන්ගේ අනාගතය ගැනත් හොඳට බැලූවා. තාත්තගේ සම වයසේ කලාකරුවන් අතරින් ඉස්සර වෙලාම ගෙදරක් හැදුවේ තාත්තා. එයාගේ යුතුකම් මොනව ද, වගකීම් මොනවද කියලා හොඳට වටහා ගෙන ජීවත් වුණ කෙනෙක්.

ලස්සන අඹ ගසක් සොයාලා, කැකිරි පැලෙන ටිකිරි සිනාවයි, මැනිකෙ මම ආයෙ ගෙදර එනවා, සීත සුළං අවට හමන්නේ, ඔබගෙ අම්මද නැත්නම් බිරිඳද, මුතු මැණික් ආදරේ නොවේ, ඔබගේ රුව මාගේමයි,

සමහර තරුණො තරුණියන්ට රැවටිලා, හා තවත් බොහෝ ගීත මගින් එම්.එස්. අප අමතන්නේ ආදරයේ අප නොදුටු ඉසව්වක් පිළිබඳවයි.

**කාමර කීයද ගබඩා කීයද**
**සැලසුම සැදුවෙත් ඔබම තමයි**
**නෑදෑයන් හට එන්න කිව්වද**
**නැකතක් බැලූවද සිරිත එයයි**
**පෙම්බර සුවඳ හමන්නේ**
**සංගීතයකි ඇසෙන්නේ**

**බුද්දක උණුසම සොයා කාමරේ සිටි අම්මගේ අතට පැන්නා. ඔන්න උක්කු බොනවා.**
**පෙම්බර සුවඳ හමන්නේ. සංගීතයකි ඇසෙන්නේ**

**එම්. එස්. ඔබ සදා අමරණීයයි.**




# ගී අරුන්දතී මියැසි වලාව

## සිරිලක සුවඳ කැනඩාවෙන්







**ශ්‍රීලාල් අමරජීව ෆොන්සේකාගේ** ගී අරුන්දතී  මියැසි වලාව සංගීත ප්‍රසංගය පසුගිය ජූනි මස 16 වෙනි සෙනසුරාදා සන්ධ්‍යාවෙහි අති උත්කර්ෂවත් ලෙස කැනඩාවේ ටොරොන්ටෝ නුවරදී පැවැත්වුනි.

ආදරණීය සහෘද රසික රසිකාවියන් ගෙන් ප්‍රසංග ශාලාව සම්පූර්ණයෙන්ම පිරී ගිය මේ ප්‍රසංගයේදී ශ්‍රීලාල් ඔහුගේම වූ නව නිර්මාණ වැඩි ප්‍රමාණයක් ගයමින් ඔවුනට උපරිම ආශ්වාදයක් සහ රස වින්දනයක් ලබාදුනි.

ශ්‍රී ලාංකික ගීත සාහිත්‍යයෙහි  ඉදිරියෙන්ම සිටිනා පූජ්‍යපාද රඹුකන සිද්ධාර්ථ හිමියන්  හා රත්න ශ්‍රී විජේසිංහයන් ඇතුළු ගේය පද රචකයින්  ශ්‍රීලාල් වෙනුවෙන්ම ගෙතූ ගී රැසකින් මෙම ප්‍රසංගය වර්ණවත් වී තිබිණි.

ශ්‍රීලාල් අමරජීව මෙවර ඉදිරිපත් කරන ලද්දේ ඔහුගේ තුන්වන ගී අරුන්දතී ප්‍රසංගයයි. පියවරෙන් පියවර ඉදිරියට පැමිණි ඔහු මෙවර ප්‍රසංගය සඳහා සුභාවිත සංගීතය වෙනුවෙන් ටොරොන්ටෝවේ ජනප්‍රියව සිටින ප්‍රිය මිතුරෝ සංගීත කණ්ඩායම සහාය කර ගත්තේය.

ශ්‍රීලාල්ගේ නවතම ගීත වෙනුවෙන් තනු හා සංගීතය නිර්මාණය කර තිබුණේ ආචාර්ය රෝහණ වීරසිංහ, විශාරද රෝහණ ධර්මකීර්ති  හා විශාරද දර්ශන වික්‍රමතුංග යන ප්‍රවීණ සංගීතඥයන් විසිනි.

යුග ගායනයෙන් අනුෂ්කා ගම්මුදලි, ඕෂානි කුරේ, බුද්ධි අමරසේන හා මිහුපමා බාලසූරිය එක්වූ අතර ප්‍රසංගය මෙහෙයුමෙන් සුනිමල් බාලසූරිය අගනා මෙහෙයක් ඉටු කළේය.

සවන රේඩියෝව,රූපන විද්‍යුත් සඟරාව, යාත්‍රා පුවත් පත්‍ර, කළාකවය රූපවාහිනියද, ගී අරුන්දතී  මියැසි වලාව සංගීත ප්‍රසංගයට අවැසි සහයෝගය ලබාදුනි.

ශ්‍රීලාල් අමරජීවගේ ගී අරුන්දතී මියැසි වලාව වෙනුවෙන් ඔහුට ශක්තියක් වූ හිත මිතුරු සහෘදයින් සමග එක්වෙමින් ඕස්ට්‍රේලියාවේ වෙසෙන අපිද සන්නස පුවත්පත හා මාධ්‍යජාලයද ඔහුට සුබ අනාගතයකට ආශිර්වාද කරමු.

**අතුල කල්දෙමුල්ල.**